දුරකථන / தொலைபேசி / Telephones } 011-2136600 / 011-2136650

ලේකම් / செயலாளர் / Secretary } 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2876169 / 011-2876181

විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail } info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla


මගේ අංකය / எனது இல. / My No. } PSC/ET/4/1/28/1/1

ඔබේ අංකය / உமது இல. / Your No. } MPS&MRA/ADM/03 /12207-1

දිනය / திகதி / Date } 2019.07.31

ලේකම්
තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය

**අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන / තාක්ෂණික නිලධර ගණයේ 111 ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය**

උක්ත කරුණ සම්බන්ධව ඔබේ සමාංක හා 2019.05.16 දිනැති ලිපිය හා බැඳේ.

02. තැපැල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන /තාක්ෂණික සේවා ගණයේ තැපැල් සේවා නිලධාරී තනතුර (MN-03) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සඳහා මෙහි ඇමුණුම 1 හි (පිටු 02 කින් සමන්විත) සඳහන් සංශෝධනයන් ඇතුලත් කිරීමට 2019.07.30 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් බඳවා ගැනීම් පටිපාටියට ඇතුලත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

අත්/කළේ: ආර්.ඩී.පී.එස්.ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්:

1) ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
2) තැපැල්පති, තැපැල් දෙපාර්තමේන්තුව - කරු. අ.ක.ස.

## තැපැල් දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන/ තාක්ෂණික සේවා ගණයේ තැපැල් සේවා නිලධාරී තනතුර (MN–03) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

පළමුවන සංශෝධනය

| අනු අංකය | ඡේද අංකය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 01 | 1.6 | දැනට මේ යටතේ සඳහන් කරුණු වලට අමතරව පහත සඳහන් යොමු අංකය හා සංශෝධිත දිනය ඇතුලත් කරනු ලැබේ.<br>යොමු අංකය: PSC/ET/4/1/28/1/1 සංශෝධිත දිනය : |
| 02 | 7.2.2.5.1. | අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අවසන් දිනට එක් එක් දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව දිස්ත්‍රික් පදනම මත සම්පූර්ණ කරනු ලැබේ. |
| 03 | 7.2.2.5.2. | දිස්ත්‍රික්කයකට අයත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම්<br>දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා තරඟ කිරීමට නම් පහත සඳහන් කරුණු අතුරින් එකක් හෝ සපුරා තිබිය යුතුය.<br>i. අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ ඉපදුණු අයෙකු විය යුතුය.<br>හෝ<br>විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු 5ක් ඇතුළත ඔහු එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසයෙන් අවුරුදු 03ක්වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටින අයෙකු විය යුතුය. හෝ<br>ii. ඔහු නොකඩවා අවුරුදු 5ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීය පාසැල් අධ්‍යාපනය ලබා තිබිය යුතුය.<br>සටහන-<br>i. යම් අපේක්ෂකයෙකුගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ.<br>ii. කිසියම් අපේක්ෂකයෙකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරඟ කිරීමට අවසර දෙනු නොලැබේ. ඉහත 7.2.2.5.2. වගන්තිය යටතේ තරඟ කිරීමට දිස්ත්‍රික්කය තෝරා ගත් පසු එය නැවත වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. |

| | | |
|---|---|---|
| 04 | 7.2.4 | බඳවා ගැනීමේ ක්‍රමය<br>1. දිස්ත්‍රික් මට්ටමින් අයදුම්පත් කැඳවා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර දෙකින්ම සමත්වන අයදුම්කරුවන්, එම පරීක්ෂණයන්හිදී ලබා ගන්නා මුළු ලකුණු සංඛ්‍යාවේ දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙල අනුව එක් එක් දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.( සේවා අවශ්‍යතාවය මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයකට ස්ථානමාරු කිරීමේ කොන්දේසියට යටත්ව)<br>2. එක් දිස්ත්‍රික්කයක සියළුම පුරප්පාඩු සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවකදී එම පුරප්පාඩු ප්‍රමාණය එම දිස්ත්‍රික්කය අයත් පළාතේ අනෙකුත් දිස්ත්‍රික්ක වල අයදුම්කරුවන්ගෙන් ලබා ඇති මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව සම්පූර්ණ කරනු ලැබේ.<br>3. ඉහත i හා ii අනුව සම්පූර්ණ කළ නොහැකි පුරප්පාඩු සංඛ්‍යාවක් පවතී නම් එම පුරප්පාඩු ප්‍රමාණය සියළුම අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙළ අනුව දිස්ත්‍රික් පදනම නොසළකා සම්පූර්ණ කරනු ලැබේ. |
| 05 | 12 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:<br>4. දිස්ත්‍රික් පදනමින් බඳවා ගනු ලබන නිලධාරියෙකු සුදුසුකම් ලැබූ දිස්ත්‍රික්කය තුළ අවම වශයෙන් වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කරන තෙක් දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු ලැබීම සඳහා සුදුසුකම් ලබනු නොලැබේ.<br>5. එලෙස වුවද සේවා අවශ්‍යතාවය මත සහ සුවිශේෂී අවස්ථාවලදී පත්වීම් බලධරයාට ඉහත සඳහන් කොන්දේසීන් නොසළකා දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු කළ හැකිය. |
| 06 | 13.3 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:<br>"සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ." ලෙස නිවැරදි කරන්න. |